# සත්‍යයෙන් සත්‍යයට

**සෙවීම, කීම, ඇසීම, දැන ගැනීම, පිළිගැනීම, සුවපත් කිරීම**

බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ සත්‍යය දැන ගැනීමට ඇති අයිතිය හා වින්දිතයන්ගේ ගරුත්වය පිළිබඳ ජාත්‍යන්තර දිනය මාර්තු 24 වෙනි දින ගෝලීය වශයෙන් සමරනු ලැබේ. එය අතීත අපයෝජනයන්ට ලක් වූ වින්දිතයින් අනුස්මරණය කිරීමේ හා සත්‍යයට හා යුක්තියට ඇති අයිතිය නගාලීමේ දිනයකි. සත්‍යයට ඇති අයිතිය මෙන්ම, මානව හිමිකම් ආරක්ෂා කිරීමේ හා සහතික කිරීමේ, ඵලදායී ලෙස විමර්ශන පැවැත්වීමේ හා ඵලදායී පිළියම් හා වන්දි ලබා දීමේ ආණ්ඩුවේ කාර්යයට හා බැඳීමට මෙම දිනය සම්බන්ධ වේ.

2015 සැප්තැම්බර් - ඔක්තෝබර්වල එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30 වෙනි සැසියේ දී සම්මත කරන ලද යෝජනාවත් සමග ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ කතිකාව යළි පණ ගැන්විණි. **අතීත අපයෝජනයන් පිළිගැනීම** හා **ශ්‍රී ලංකාව තුළ විමර්ශනය කිරීම, නීතිය හමුවට පැමිණවීම, හානිපූරනය කිරීම** හා **ප්‍රතිසංස්කරණය කිරීම** යන කරුණු සම්බන්ධයෙන් ගත් කල ශ්‍රී ලංකා ආණ්ඩුවේ අනුග්‍රාහකත්වය මගින් ඉදිරිපත් කරන ලද එකඟතා යෝජනාව වැදගත් පියවරකි. නීති ප්‍රතිසංස්කරණය හා ඉඩම් ඒවායේ මුල් අයිතිකරුවන්ට මුදා හැරීම වැනි විශ්වාසය ගොඩ නැගීමේ පියවරයන්ට අමතරව ශ්‍රී ලංකා ආණ්ඩුව ශ්‍රී ලංකාවේ යාන්ත්‍රණ හතරක් එනම් විශේෂ අධිකරණයක්, සත්‍යය, යුක්තිය, සමගි සන්ධානය හා නැවත ඇති නොවීම පිළිබඳ කොමිෂන් සභාවක්, අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලයක් හා හානිපූරනය කිරීමේ කාර්යාලයක් පිහිටුවීමට පොරොන්දු වී තිබේ. මේවා ශ්‍රී ලංකාවේ සමගි සන්ධානය සඳහා වන තීරණාත්මක පියවර වන අතර සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

2016 ශ්‍රී ලංකාවට හා ශ්‍රී ලාංකිකයින්ට වැදගත් වසරක් වනු ඇත. නව ශ්‍රී ලංකාවට පොරොන්දු රාශියක් තිබේ. බෙහෙවින් අවශ්‍ය සමගි සන්ධානය ඇතිකර ගැනීමට අවස්ථාවක් ලබා ගැනීමට නම් අතීත අපයෝජනයන් පිළිගැනීම හා සැලකිල්ලට ගැනීම හා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම ඉතා වැදගත් වේ.

මෙම චිත්‍ර ප්‍රදර්ශනය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) හා විහව් සෞන්දර්ය කලා ඇකඩමිය (VAFA) විසින් කලා මාධ්‍ය හරහා සංක්‍රමණීය යුක්තිය ගවේෂණය කිරීම සඳහා පවත්වනු ලබන ඒකාබද්ධ සහයෝගිතා ක්‍රියාකාරිත්වයකි. 2016 පෙබරවාරිවල දී චන්ද්‍රගුප්ත තේනුවර හා භවානි ෆොන්සේකා විසින් පවත්වන ලද ශ්‍රී ලංකාව මුළුල්ලෙන් පැමිණි නැගී එන කලා ශිල්පීන් දාහතර දෙනෙකු සහභාගි වූ නේවාසික වැඩමුළුවක දී සංක්‍රාන්ති යුක්තිය හා ශ්‍රී ලංකාවට එහි ඇති අදාළත්වය පිළිබඳව සාකච්ඡා හා විවාද කරනු ලැබිණ. ඉන් අනතුරුව කලා නිර්මාණ නිෂ්පාදනය කරන ලද අතර ඒවා මෙම ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශනය කෙරේ.

ප්‍රදර්ශනය බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ සත්‍යය දැන ගැනීමට ඇති අයිතිය හා වින්දිතයන්ගේ ගරුත්වය පිළිබඳ ජාත්‍යන්තර දිනය වන මාර්තු 24 වෙනි දින ආරම්භ වේ. මෙම දිනය සහ එය සංකේතවත් කරන දෙය ශ්‍රී ලාංකිකයින්ට අතීතය පිළිගැනීමේ හා සත්‍යය, යුක්තිය, හානිපූරනය කිරීම හා නැවත ඇති නොවීම ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව සිත් කා වදින සිහිපත් කිරීමක් වෙයි.

සංක්‍රමණීය යුක්තිය පිළිබඳ තේමාව වටා වන කලා නිර්මාණ හා සාහිත්‍යය නිර්මාණ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ සාකච්ඡාවන් ව්‍යාප්ත කරනු ඇතැයි ද ආවර්ජනය, ප්‍රතිකර්මය හා ප්‍රතිසංස්කරණය සඳහා අවකාශයක් සපයනු ඇතැයි ද අපි බලාපොරොත්තු වෙමු.